# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 12,210—1960 ඔක්තෝබර් 7 වැනි සිකුරාදා—7.10.1960**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 223 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | — | අය-වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 223 | මාගී කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් | — | විවිධ දැන්වීම් ... ... | 225 |


## පළාත් පාලන නිවේදන

ඇල්ජිඩී—ජිබී 14/5/10.

### 1952කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) ආඥාපනත

1952කේ අංක 6 දරණ ප්‍රදෙශාධිකාරී සභා (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා ආඥාපනතේ 3 වෙනි වගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ වේරගොඩ ගම් ප්‍රදේශයේ ගම්කායයී සභාව විසින් සම්මතකරගන්නා ලද පහත දැක්වෙන යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙහි පළ කරණු ලැබේ.

**යෝජනාව**

ප්‍රදේශ පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරණලද්දාවූද, සෙනේට් මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමතකරණලද බව 1953 අගෝස්තු මස 7 වෙනි දින අංක 10,560 ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරණ ලද්දාවූද පොදු ආදශී අතුරු ව්‍යවස්ථාවල අංක 1 සිට 37 දක්වා වූ කාණ්ඩ (දෙකම ඇතුලුවයි) මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මතකර ගැනීමට වේරගොඩ ගම්ප්‍රදේශයේ ගම්කායයී සභාව විසින් 1952කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කරණු ලැබේ.

ඇන්. කේ. පීටර් ද සිල්වා,
වේරගොඩ ගම්කායයී සභාවේ සභාපති.

1960 සැප්තැම්බර් 1 වෙනි දින,
මිටියාගොඩ-වේරගොඩ ගම්කායයී සභා කායයාලයේ දීය.

9635

---

## අතුරු ව්‍යවස්ථා

ඇල්ඩී—බී 19/60 ජිබී 14/16/11

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වෙනි පරිච්ඡේදය) 49 වෙනි වගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ කතළුව ගම්ප්‍රදේශයේ ගම්කායයී සභාව විසින් සම්පාදිතව 1947 සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියේ (3) වෙනි උප වගන්තිය යටතේ පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම්තැන.

1960ක්වූ සැප්තැම්බර් මස 20 වෙනි දින,
කොළඹදීය.

**රථවාහන හා සතුන් පිළිබඳ බද්ද**

1. (1) ආඥාපනතේ 47 වෙනි වගන්තිය යටතේ අයකරනු ලබන රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත්වූ යම් රථවාහනයක් හෝ සතෙකු අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන හෝ සිටින්නාවූ සෑම අයෙකු විසින්ම සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන්කොට ඇති "ඒ" උපලේඛනයේ සඳහන් ෆෝර්මයේ ප්‍රකාර විස්තර උපලේඛනයක් සභාපතිතුමාට සැපයිය යුතුයි. මේ ෆෝර්මය ගම්කායයී සභා කාර්යාලයෙන් ලබාගත හැකිය. (2) ආඥාපනතේ 47 වෙනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳීසිටින අය විසින් 1961 වර්ෂය වෙනුවෙන් (1) වෙනි ඡේදයේ සඳහන් එම උප ලේඛනය සම්පූර්ණකොට 1960 දෙසැම්බර් මස පළමුවැනි දින හෝ ඊට මත්තෙන් ප්‍රධානතුමාවෙත යැවිය යුතුයි. එකී අය ඒ වාහනය හෝ සතා අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන හෝ සිටින්නාවූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන්වත් ඔහුගෙන් එබඳු උපලේඛනයක් අවශ්‍ය නැත්තේය.

2. ආඥාපනතේ 47 (2) වෙනි වගන්තියේ සඳහන් විධිවිධානවලට යටත්ව 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයූමාවූ සෑම අයෙක්ම තවදුරටත් දැනුම්දෙනු ලැබීමක් නැතිව—

(අ) ඒ උපලේඛනයේ සඳහන් රථවාහන හා සතුන් සඳහා වූ බද්ද 1961 අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ මාර්තු මස තිස්එක්වෙනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති. තවද,

(ආ) ඊට පසු එක් එක් වර්ෂය වෙනුවෙන් ඒ උපලේඛනයේ සඳහන් තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ එකී රථවාහන හා සතුන් සඳහාවූ එකී එක් එක් අවුරුද්දේ අප්‍රේල් මාසයේ තිස්වෙනිදාට හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත්වෙති.

3. 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයූවාට පසු යම් කිසිවෙකු විසින් ඒ උපලේඛනයේ සඳහන් නොකරන ලද්දාවූද, ආඥාපනත යටතේ බද්දට යටත්වූද යම් රථවාහනයක් හෝ සතෙකු අත්පත්කරගෙන හෝ තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේනම් හෝ, 1 වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් උපලේඛනයක් සපයා නැත්තාවූ යම්කිසිවෙකු විසින් එකී බද්දට යටත් යම් රථවාහනයක් හෝ සතෙකු පළමුවෙනිවරට අත්පත්කරගෙන හෝ තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේනම් එවිට ඒ අය විසින් එබඳු යම් රථවාහනයක් හෝ සතෙකු අත්පත්කරගැනීමේ හෝ තබාගැනීමට නොහොත් පාවිච්චි කිරීමට පටන් ගැනීමේ දින එක මාසයක් ඇතුලතදී සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් කොට ඇති "ඒ" උපලේඛනයේ සඳහන් ෆෝරමයේ ප්‍රකාරයට ලියවිල්ලකින් හෝ දැන්වීමකින් එසේ අත්පත් කරගත් බව තවදුරටත් ප්‍රධානතුමාට දැන්විය යුතුයි.

4. ආඥාපනතේ 47 (2) වෙනි වගන්තියේ විධිවිධානවලට යටත්ව 3 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ ලේඛනය සැපයූවාවූ සෑම අයෙක්ම එකී ලේඛනය සැපයූ අවුරුද්ද වෙනුවෙන්ද, ඊට පසු සෑම අවුරුද්දක් වෙනුවෙන්ද එකී ලේඛනය සඳහන්කරනු ලැබ තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනයෙහි හෝ තිබෙන්නාවූ රථවාහන හා සතුන් සඳහාවූ බද්ද ඒ සඳහා ප්‍රධානතුමා විසින් තමාට දැනුම් දෙනු ලබන යම් කාලසීමාවක් ඇතුලතදී ගෙවීමට බැඳිසිටිති.

5. (1) 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ ලේඛනය හෝ සැපයූවාට පසු ඒ උපලේඛනයට ඇතුලත්කලාවූ හෝ යම් රථවාහනයක් හෝ සතුන් සම්බන්ධයෙන්වූ බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥාපනතේ 47 (3) වෙනි වගන්තිය යටතේ තමා නිදහස්කිරීමට අයිතිවාසිකම් කියා සිටින සෑම අයෙකු විසින්ම මෙසේ නිදහස්කිරීමට අයිතිවාසිකම් කියාසිටින්නේ අසවල් අසවල් හේතුනිසායයි දක්වෙන ලියවිල්ලකින්වූ දැන්වීමක් වහාම ප්‍රධානතුමා වෙත යැවිය යුතුයි.

(2) 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛන හෝ 3 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ ලේඛනය හෝ සැපයූවාට පසු ඒ රථවාහන හෝ සතා තබාගැනීම හෝ පාවිච්චිකිරීම නතරකලාවූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත්හැරියාවූ සෑම අයෙකු විසින්ම තමා ඒ සතා හෝ රථවාහන තබාගැනීම හෝ පාවිච්චිකිරීම නතරකළ බව නොහොත් ඒ පිළිබඳව අයිතිවාසිකම් අත්හැරියාවූ බව වහාම ප්‍රධානතුමාවෙත ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

6. යම්කිසිවෙකු විසින් බද්ද ගෙවූවිට ප්‍රධානතුමා විසින් ඒ බද්ද ගෙවූ රථවාහනය වෙනුවෙන් ඒ අයට මෙහි පහත සඳහන්කොට ඇති "බී" උපලේඛනයේ ප්‍රකාරයට ඒ ඒ රථවාහන සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශේෂ අකුරුද තහඩුව නිකුත්කරන අවුරුද්ද දක්වෙන ඉලක්කම්, රථවාහන රෙජිස්ටරයේ ඒ ඒ රථවාහන පිළිබඳවූ අංකයද සඳහන්කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුයි. එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙනයම් ලෙසකින් හෝ නොපැහැදිලිව නොහොත් මැකීගොස් තිබෙනහොත්, ඒ තහඩුව අයිතිකාරයා විසින් ප්‍රධානතුමාට ආපසු භාරදිය යුතුයි. තවද, ඔහු විසින් ශත 50ක් (පනහක්) ගෙවූවිට ඔහුට අළුත් තහඩුවක් නැවත ලබාගැනීමට අයිතිවාසිකම් තිබේ. එබඳු යම් තහඩුවක් නැතිවී හෝ සොයාගෙන තිබෙන බැව් දිවුරුම් සහතිකයකින් හෝ වෙනයම් ලෙසකින් හෝ ප්‍රධානතුමාට ඒත්තු ගැනීමට සැලැස්සුවහොත් එතුමා විසින් අයිතිකාරයාගේ ඉල්ලීම පිටත් ඔහු විසින් ශත පනහක් ගෙවනු ලැබූවිටත් අළුත් තහඩුවක් නිකුත් කළ හැකිය.

7. සෑම රථවාහනයකම අයිතිකරු විසින් හෝ භාරකරු විසින් 6 වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ රථවාහනය වෙනුවෙන් නිකුත් කරන ලද තහඩුව ඒ රථවාහනයේ කාටත් පෙනෙන තැනක සවිකළ යුතුයි.

8. ප්‍රධානතුමා විසින් හෝ එතුමාගෙන් ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියෙකු විසින් හෝ ඕනෑම පොලිස් නිලධාරියෙකු විසින් හෝ ඕනෑම මාවතක හෝ පාරක හෝ ගමනාගමනයේ යෙදී තිබෙන රථවාහනයක්, ඒ රථවාහනයෙහි 7 වෙනි අතුරු ව්‍යවස්ථාවෙහි ප්‍රකාර සවිකොට තිබිය යුතු තහඩුව පරීක්ෂාකර බැලීම පිණිස නවත්වා නතර කිරීම නීත්‍යානුකූල වන්නේය. තවද, ප්‍රධානතුමා විසින් හෝ එකී වෙනත් නිලධාරියා විසින්, ඉල්ලීමක් කර සිටි කල්හි එකී ඕනෑම රථයක භාරකාරයා විසින් හෝ ඒ රථය පදවන්නා විසින් හෝ ඒ රථය නවත්වා ප්‍රධානතුමාට හෝ එකී නිලධාරියාට එකී තහඩුව පරීක්ෂාකර බැලීමට ඉඩදිය යුතුයි.

9. 1940 ජූලි මස 12 වෙනි දින අංක 8,633 දරණ ගැසට් පත්‍රයේ පල කරන ලද රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා මෙයින් අවලංගු කරනු ලැබේ.

10. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කාර්‍ය සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ.

"කාර්‍ය සභාව" යනුවෙන් ගාලු දිස්ත්‍රික්කයේ කතළුව ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ.

"ආඥාපනත" යනුවෙන් ගම්සභා ආඥාපනත (198 වෙනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

## "ඒ" උපලේඛනය

### කතළුව ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව

රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථාවල ප්‍රකාර සැපයිය යුතු රථවාහන හා/* හෝ සතුන් පිළිබඳ විස්තර උපලේඛනයයි.

අයිතිකරුගේ නම :————.

ජන්දදායක කොට්ඨාශ අංකය :————.

ගම :————.

| රථවාහන හා/* හෝ සතුන් පිළිබඳ විස්තරය | ගණන (වචන වලින්) | වෙනත් විස්තර (බයිසිකලයක්නම් සාදන ලද අයගේ නොම්මරය සඳහන් කරනු) |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින් රික්ෂෝ කරත්ත හැර ඕනෑම අන්දමක වාහන ... | | |
| ගොන් දෙන්නා බඳින බර කරත්ත හෝ තිරික්කල ... | | |
| තනි ගොනා බඳින බරකරත්ත හෝ තිරික්කල ... | | |
| අත් කරත්ත ... | | |
| ජින් රික්ෂෝ කරත්ත ... | | |
| බයිසිකල් ... | | |
| අලි ... | | |
| අශ්වයෝ ... | | |
| අශ්වතරයෝ ... | | |
| බූරුවෝ ... | | |

* නුවුවමනා වචන කපාදමනු.

මගේ දැනීමේ හැටියට ඉහත සඳහන් විස්තර සෑම අතින්ම සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් ප්‍රකාශ කරමි.

————,
හිමිකරුගේ හෝ අයිතිකරුගේ අත්සන.

දිනය :————.

## "බී" උපලේඛනය

කරත්තයක්, තිරික්කලයක් හෝ ජින් රික්ෂෝ කරත්තයක් හැර වෙන ඕනෑම අන්දමක වාහනයක් සඳහා ... ... ක. ග. වා.

ඕනෑම අන්දමක සෑම ගොන් දෙන්නා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ක. ග. බ. ක.

සෑම තනි ගොනා බඳින බරබාග කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ක. ග. ක.

සෑම ජින් රික්ෂෝ කරත්තයක් සහ සෑම අත් කරත්තයක් සඳහා ... ... ක. ග. අ. ක.

සෑම බයිසිකලයක් සඳහා ... ... ක. ග. බ.

9649

# විවිධ දැන්වීම්

## අම්බලන්ගොඩ නගර සභාව

1939 නොම්මර 61 දරණ නගර සභා ආඥාපනතේ 173 (3) වෙනි වගන්තිය යටතේ අම්බලන්ගොඩ නගර සභා සීමාව තුළ පිහිටි නිශ්චල දේපල වල වාර්ෂික තක්සේරුවෙන් 1961 වර්ෂයට සියයට එකොළහක ඒකාබද්ධ බද්දක් පසුගිය වර්ෂයේ මෙන්ම අයකිරීමට පනවා තිබෙන බවද, එම බද්ද පිළිවෙළින් ජූනි 30 සහ දෙසැම්බර් 31 දින වල වාර දෙකකින් ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. ඩබ්ලිව්. විල්ෆ්‍රඩ් ද සිල්වා,
අම්බලන්ගොඩ නගර සභාවේ සභාපති.

1960 සැප්තැම්බර් 22 වෙනි දින,
අම්බලන්ගොඩ නගර සභා කාර්‍යාලයයේදීය.

9627/1

---

## අම්බලන්ගොඩ නගර සභාව

### රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද

1939 නොම්මර 61 දරණ නගර සභා ආඥාපනතේ 175 වෙනි වගන්තිය යටතේ පහත සඳහන් උපලෙඛනයෙහි නම්කරන ලද රථ වාහන සහ සතුන්ට ඒ උපලේඛනයෙහි එම වාහන හා සතුන් කෙළින් සඳහන් කර තිබෙන ගාස්තු පසුගිය වර්ෂයට මෙන්ම 1961 වර්ෂයටද අම්බලන්ගොඩ නගර සභා සීමාව තුළ පනවා ඇති බවත්,

යථොක්ත ආඥාපනතේ 176 (3) වෙනි වගන්තිය යටතේ එකී බදු 1961 මාර්තු මස 31 වෙනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් දැනුම් දෙනු ලැබේ.

### උපලෙඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, ට්‍රයිසිකල්, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ, බයිසිකල් සහ රෝද තුනේ බයිසිකල් හැර ඕනෑම රථයකට ... ... | 5 | 0 |
| ඕනෑම බයිසිකලයකට හෝ රෝද තුනේ බයිසිකලයකට— | | |
| (ඒ) වෙළඳ කාර්‍යයන් සඳහා පාවිච්චි කරන්නේනම් ... | 3 | 0 |
| (බී) වෙළඳ කාර්‍යයන් හැර වෙන ඕනෑම කාර්‍යයක් සඳහා පාවිච්චි කරනු ලබන්නේ නම් ... ... | 1 | 0 |
| (සී) ඕනෑම අන්දමක ගොන් දෙන්නා බඳින බරකරත්තයක් හෝ තිරික්කලයක් වෙනුවෙන් ... ... | 4 | 0 |
| (ඩී) ඕනෑම අන්දමක තනි ගොනා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් වෙනුවෙන් ... ... | 2 | 50 |
| (ඊ) ඕනෑම අත් කරත්තයක් වෙනුවෙන්... ... | 2 | 0 |
| (ඇෆ්) ඕනෑම ජින් රික්ෂෝ රථයක් වෙනුවෙන් ... | 2 | 50 |
| (ජී) ඕනෑම අශ්ව පෝනියෙක් හෝ බූරුවෙක් වෙනුවෙන් | 2 | 50 |

පී. ඩබ්ලිව්. විල්ෆ්‍රඩ් ද සිල්වා,
අම්බලන්ගොඩ නගර සභාවේ සභාපති.

1960 සැප්තැම්බර් 22 වෙනි දින,
අම්බලන්ගොඩ නගර සභා කාර්‍යාලයයේදීය.

9627/2

---

## අම්බලන්ගොඩ නගර සභාව

### 1961 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු—සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත 334 වෙනි පරිච්ඡේදය

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 334 වෙනි පරිච්ඡෙදයේ 4 වෙනි කොටසේ ප්‍රකාර අම්බලන්ගොඩ නගර සභා සීමාව තුළ තබාගන්නා සෑම බල්ලෙකුට හා බැල්ලියකට 1960 වර්ෂයේ අය කරන ලද ගාස්තුව වන රුපියල් එකයි ශත පණහ 1961 වර්ෂයටද අයකිරීමට පනවා ඇති බවද, එකී ගාස්තු 1961 අප්‍රේල් මස 1 වෙනි දින හෝ ඊට පෙර හෝ ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. ඩබ්ලිව්. විල්ෆ්‍රඩ් ද සිල්වා,
අම්බලන්ගොඩ නගර සභාවේ සභාපති.

1960 සැප්තැම්බර් 22 වෙනි දින
අම්බලන්ගොඩ නගර සභා කාර්‍යාලයයේදීය.

9627/3

---

## උඩුගහපත්තු ගම්කාර්ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලෙඛනයෙහි නම් සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1960වේ වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට කොළඹ දිස්ත්‍රික්කයේ උඩුගහපත්තු ගම්කාර්ය සභා ප්‍රදේශයේ ඇතුළත පදිංචි, ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ නිසායයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම් ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිත වූ අංක 6 දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. සී. අබේසිංහ,
උඩුගහපත්තු ගම්කාර්ය සභාවේ සභාපති.

ගම්සභා කාර්යාලය,
පොල්ගස්ඕවිට,
1960 සැප්තැම්බර් 20 වෙනි දින දීය.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | වෙළඳාම් කරන ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| ජී. ඇස්. ඇස්. ගවුස්, 35, දිග රෝල්ල, මොරටුව. | කහතුඩුව මංසන්ධියේ හැල්පතේ ඕවිටෙ | හරක්මස් |

9633

---

## විශෙෂ නිවේදනයයි

1960 ඔක්තෝබර් 19 වැනි බදාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1960 ඔක්තෝබර් 21 වැනි දින නිකුත්කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1960 ඔක්තෝබර් 15 වැනි සෙනසුරාදා පස්වරු 12.30ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1960 සැප්තැම්බර් 27 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරනු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණිත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අය කරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30ට ප්‍රථමයෙන්).

13. ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... | එක් කාණ්ඩයක් සඳහා ... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිට පතකට ... ... | ... ... | 25 | |
| | තැපැල් ගාස්තුවත් සමග ... | 31 | |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | ... ... | 10 | |
| | තැපැල් ගාස්තුවත් සමග ... | 14 | |

15. පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.